# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2363/22 - 2023 දෙසැම්බර් මස 19 වැනි අඟහරුවාදා - 2023.12.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2005 අංක 06 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ පනවනු ලබන නියමය**

2005 අංක 06 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මෙම නියමය මගින්, 2024 ජනවාරි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි 2022 මැයි මස 31 දිනැති අංක 2282/26 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* පළකල නියමය, එහි 1 ඡේදයේ (ආ) උප ඡේදයට පහත උප ඡේදය ආදේශ කිරීම මගින් සංශෝධනය කරමි.

> " (ආ) මෙම ඡේදයේ (අ) උප ඡේදය යටතේ දක්වා ඇති භාණ්ඩ ආනයනය හැර අනෙකුත් භාණ්ඩ ආනයනය සහ/හෝ සැපයීම හෝ සේවා සැපයීම මත සියයට දහ අටක (18%) අනුප්‍රමාණයට."

2024 ජනවාරි මස 01 වන දින සිට බලපැවැත්වෙන වන පරිදි 2022 අගෝස්තු මස 31 දිනැති අංක 2295/08 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* මෙයින් අවලංගු කෙරේ.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 දෙසැම්බර් මස 19 වන දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

EOG 12 - 0318



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*